# මුදල් කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 "ර" ව්‍යවස්ථාව ප්‍රකාර පිහිටුවා ඇති

# நிதி ஆணைக்குழு

(அரசியலமைப்பின் 154 "ஈ" உறுப்புரையின் கீழ் தாபிக்கப்பட்டது)

# FINANCE COMMISSION

(Established under Article 154 "R" of the Constitution)

03, සරණ මාවත,
රාජගිරිය, ශ්‍රී ලංකාව.

இல. 03, சரண மாவத்தை,
ராஜகிரிய, இலங்கை.

03, Sarana Mawatha,
Rajagiriya, Sri Lanka.


මගේ අංකය / எனது இல. / My No. } FC/PDP/3/2021/NCP

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2021.12:09

ප්‍රධාන ලේකම්
උතුරු මැද පළාත.

**<u>විශේෂ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම - 2021</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ ඔබේ අංක NCP/CS/PD/D/04/06 හා 2021.12.07 දිනැති ලිපිය හා බැඳේ.

ස්වයං රැකියා ප්‍රවර්ධනය යටතේ සෘජු ප්‍රදාන ලෙස සානුබල දීමනා ලබාදීමේදී ප්‍රතිලාභී දායකත්වය ලබා ගැනීමෙන් අපේක්ෂා කරනු ලබන්නේ ස්වයං රැකියාවක යෙදීමට දැඩි කැපවීමක් හා උනන්දුවක් ඇති, දැනට අදාල ක්ෂේත්‍රයක ස්වයං රැකියාවක කැපවීමෙන් නියැලෙන හා සාර්ථකව එම කටයුතු කරගෙන යාමට නිපුණතාවයක් ලබා ඇති සුදුසුම පුද්ගලයන් තෝරා ගෙන ඔවුන්ගේ ස්වයං රැකියා ප්‍රවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය උපකරණ ලබා ගැනීමට උපකාර කිරීමෙන් ඔවුන් දිරිගැන්වීම ය.

ස්වයං රැකියා උපකරණ කිසිදු ප්‍රතිලාභී දායකත්වයක් ලබා නොගෙන ලබාදීම තුලින් එවැනි උපකරණ ලබා ගැනීමට ඉහත කී ආකාරයේ මූලික පදනමක් නොමැති බොහෝ පුද්ගලයින්ද ඉදිරිපත් විය හැකි අතර එවිට ඔවුන් අතරින් සුදුසුම ප්‍රතිලාභීන් තෝරා ගැනීම අපහසු වේ. තවද, නොමිලේ සෘජු ප්‍රදාන ලබාදෙන විට විශාල ඉල්ලුම්කරුවන් පිරිසක් ප්‍රදාන අපේක්ෂා කරන අතර ඔවුන්ගේ බලාපොරොත්තු කඩවීම නිසා පළාත් සභාව සම්බන්ධයෙන් අප්‍රසාදය පළකරන පසුබිමක් නිර්මාණය විය හැකිය. එමෙන්ම එම සෘජු ප්‍රදානය ලැබිය යුතු පුද්ගලයන් වෙනුවට නුසුදුස්සන්ට එම අවස්ථාව ලැබීම තුලින් අපේක්ෂිත ස්වයං රැකියා ප්‍රවර්ධනයක්ද පළාත තුල සිදු නොවීමට ඉඩ ඇත. සෘජු ප්‍රදාන සඳහා ප්‍රතිලාභී දායකත්වය ලබාගැනීම තුලින් පවත්නා සීමිත මූල්‍ය සම්පත් යොදවා වැඩි පිරිසකට ව්‍යාපෘති සහන ලබාදීමේ හැකියාවද පුළුල් වෙයි.එබැවින් කිසිදු ප්‍රතිලාභී දායකත්වයක් නොමැතිව සෘජු ප්‍රදාන ලබාදීමට එකඟ විය නොහැකිය.

එසේ වුවද, උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය මත ඔබ විසින් කරන ලද ඉල්ලීම සලකා බලා සෘජු ප්‍රදාන ලබාදීමේදී පහත අයුරින් සහන ලබාදීමට කටයුතු කිරීමට එකඟතාවයක් ලබාදිය හැකි බව කාරුණිකව දන්වා සිටිමි.

1. ලබාදෙන උපකරණයේ මුළු වටිනාකම රු.ලක්ෂයට අඩු වන විට 15%ක ප්‍රතිලාභී දායකත්වයක් ලබාගැනීම
2. ලබාදෙන උපකරණයේ මුළු වටිනාකම රු.ලක්ෂය හෝ ඊට වඩා වැඩි නම් 25%ක ප්‍රතිලාභී දායකත්වයක් ලබාගැනීම

මෙම සහනය ලබාදීම මෙම අවස්ථාවට පමණක් සීමා විය යුතු බව ඉතා කාරුණිකව දන්වමි.

ඒ.ඩී.එම්.යූ.ඩී.බී තෙන්නකෝන්
ලේකම්
මුදල් කොමිෂන් සභාව

පිටපත්:

I. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්), උතුරු මැද පළාත
II. ආණ්ඩුකාරවර ලේකම්, පළාත් ආණ්ඩුකාර කාර්යාලය, උතුරු මැද පළාත
III. සහකාර විගණකාධිපති, උතුරු මැද පළාත


| | | | | | |
|---|---|---|---|---|---|
| සභාපති / தலைவர் / Chairman | (+94)011 2886724 | කාර්යාලය / அலுவலகம் / Office | (+94)011 2888747 | වෙබ් අඩවිය / இணையத்தளம் / Website | www.fincom.gov.lk |
| ලේකම් / செயலாளர் / Secretary | (+94)011 2888324 | ෆැක්ස් / தொலைநகல் / Fax | (+94)011 2868679 | විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail | info@fincom.gov.lk |